# පහතරට ගණින්නාන්සේලාගෙන් සිදු වූ ශාසනික සාමාජික හා සාහිත්‍යයික සේවාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
29 NOV 2014
UNIVERSITY OF KELANIYA

සිටිනාමළුවේ සීලවංස

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 926 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2011 සැප්තැම්බර්

# සාර සංග්‍රහය

ගණින්නාන්සේලා යනු මහනුවර යුගයේ උපසම්පදා භික්ෂූන් නො සිටි කාල සීමාවක් තුළ සිටි පැවිදි පිරිසයි. ''ගණින්නාන්සේලා'' යන වචනය ''සාමණේරයන් වහන්සේලා'' යන අර්ථය ගෙන දෙයි. එමෙන් ම ගණින්නාන්සේලා හා එකල ම සිටි සිල්වතුන් එක ම පිරිසක් නො වේ.

''ගණින්නාන්සේ'' යන යෙදුම පිළිබඳ අර්ථ, කෝෂ ග්‍රන්ථවල හා ප්‍රාථමික මෙන් ම ද්විතීයික මූලාශ්‍රවල ද දක්වෙයි.

පහතරට ගම්බිම් නිජබිම කරගත් ගණින්නාන්සේලා ''පහතරට ගණින්නාන්සේලා'' ලෙස හඳුන්වයි. ලාංකේය රාජ්‍ය පාලනයේ අර්බුද, ද්‍රවිඩ බලපෑම්, පෘතුගීසි බලපෑම් හා ලන්දේසි බලපෑම් මත ප්‍රභවය වූ පහතරට ගණින්නාන්සේලා ආධ්‍යාත්මික දියුණුවෙන් යුතු ව සිටි බවට සාධක බහුල ය. ආධ්‍යාත්මික පරිහානියෙන් යුතු ගණින්නාන්සේලා සිටි බවට සාධක සෙවීම අසීරු ය.

විවිධ නම්වලින් හඳුන්වා ඇති පහතරට ගණින්නාන්සේලා තමන්ට වඩා බාල වූ ද එමෙන් ම තම ගුරුවරයාගෙන් පැවිදි බව ලබා සිටියා වූ ද සද්ධිවිහාරික පැවිදි පිරිස තම සිසු පරපුරේ තබා රැක බලා ගත් නිසා ගණින්නාන්සේලාගේ පැවැත්ම තහවුරු විය.

උඩ පාත දෙරට ම සම්භාවනාවට පාත්‍ර වූ පහතරට ගණින්නාන්සේලා අතරින් ගොවිගම කුලයට අයත් ගණින්නාන්සේලා ව්‍යවහාර වර්ෂ 1753 දී ගෙන ආ සියම් උපසම්පදාව ලබා භික්ෂූත්වයට පත් වූ අතර ඉන් පසු පිහිටුවන ලද අමරපුර නිකාය හේතුකොට අන් කුලවලට අයත් ගණින්නාන්සේලාට ද උපසම්පදාව හිමිවීමෙන් සියලු ම ගණින්නාන්සේලා භික්ෂූ වන්නට වූහ. ඊටත් පසු පිහිටුවන ලද රාමඤ්ඤ නිකාය ද ඒ සඳහා තවත් උපකාරී විය.

තම බාල පැවිදි සොහොයුරන් සිසු පරපුරෙහි තබා රැක ගැනීම, විහාරස්ථාන ඉදිකිරීම, විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, ඒවා රැක බලා ගැනීම බුද්ධ ප්‍රතිමා, ප්‍රතිමා ගෘහ සහ චෛත්‍ය ඉදිකිරීම, පහතරට හා උඩරට වැසියන් පින්කම්වලට යොමු කිරීම, ''සිල්වත් සමාගම'' පිහිටුවීම හා උඩරට පූජාස්ථාන රැක ගැනීම පහත රට ගණින්නාන්සේලාගෙන් සිදු වූ ආගමික සේවා වෙයි.

කාලීන අවශ්‍යතා මත ඒදඬු, පාලම් හා මඩම් කරවීම, නැකැත් බැලීම, වෙදකම් කිරීම, යකුන්ගෙන් වැඩ ගැනීම හා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කිරීම, නැතිබැරි අයට පිහිට වීම පහතරට ගණින්නාන්සේලාගෙන් සිදු වූ විශිෂ්ට ගණයේ සමාජසේවා වෙයි.

පහතරට ගණින්නාන්සේලාගෙන් සිදු වූ සාහිත්‍යයික සේවාව ලෙස, දුෂ්කර සමයක වුව ද විවිධ අයුරින් ඉගෙනගෙන දැනුමෙන් පෝෂණය වීම, පොත්පත් ලිවීම, කියවීම හා සුරක්ෂිත කිරීම, උඩරට ශාස්ත්‍රීය කටයුතු ආරම්භ කොට දියුණු කිරීම, විද්‍යාස්ථාන රැක

ගැනීම, විද්‍යාස්ථාන බිහි කිරීම, චිත්‍ර මූර්ති හා කැටයම් ආදී කලා කටයුතුවල නිරත වීම, දක්විය හැකි ය.

එසේ පහතරට ගණින්නාන්සේලා පරිහානිකර සමයක වුව ද රට දැය සමය උදෙසා විවිධ අයුරින් වෙහෙසී කටයුතු කිරීම මත ආගමික සාමාජීක හා සාහිත්‍යයික සුරක්ෂිතභාව සහවුරු විය.